JMC vLearning
"your virtual learning partner"

ඒකාබද්ධ ලාභාලාභ ගිණුම

AAT අදියර III

FAR - මූල්‍ය වාර්තාකරණය

සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

FARPack21

1

Sandeepa Jayasekera - JMC

AAT තෙවෙනි අදියර මූල්‍ය වාර්තාකරණය

AAT SRI LANKA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

1

ඒකාබද්ධ ලාභාලාභ ගිණුම

Sandeepa Jayasekera - JMC 2

2

JMC vLearning "your virtual learning partner"



3

හර		ලාභාලාභ	බැර
විකුණුම් පිරිවැය	XX	විකුණුම්	XXX
පරිපාලන වියදම්	X	වෙනත් ආදායම්	X
අලෙවිකරණ වියදම්	X		



JMC Jayasekera Management Centre 4

4

ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන විට පැවති මූලධර්ම ඒකාබද්ධ ලාභාලාභ ගිණුමට ද අදාල වේ.

ඒකාබද්ධ ලාභාලාභ ගිණුම පිළියෙල කිරීමේ පියවර

ප්‍රශ්නය කියවන්න
- අවශ්‍යතාවය බලන්න
- වැදගත් කරුණු යටින් ඉරක් ගහන්න

→ **ආකෘති**
- ඒකාබද්ධ ලාභාලාභ ආකෘතිය
- පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටස

→ **ඒකාබද්ධ ද්විත්ව සටහන්**

→ **පේළියෙන් පේළිය එකතු කිරීම**

→ **අවසාන කිරීම්**
- පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටස
- ඒකාබද්ධ ලාභාලාභ ගිණුම

JMC vLearning "your virtual learning partner"

ඒකාබද්ධ ලාභාලාභ ආකෘතිය

xxx සමූහය

ඒකාබද්ධ ලාභාලාභ ගිණුම

20------ /03/31 න් අවසන් වූ වර්ෂය සඳහා

රු. 000

විකුණුම්		
විකුණුම් පිරිවැය		
දළ ලාභය		
වෙනත් ආදායම්		
පරිපාලන වියදම්		
විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම		
මූල්‍ය වියදම්		
බදු පෙර ලාභය		
බදු		
බදු පසු ලාභය		
පරිපාලකගෙන් කොටස් හිමියන්ට අයත් ලාභය		
පාලනයට යටත් නොවන අයිතියට අයත් ලාභය		

මුළු ලාභයෙන් පාලනයට යටත් නොවන අයිතියේ කොටස අඩු කළ පසු අගය

පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටස වගුවෙන් ලබාගත හැක.

7

ඒකාබද්ධ ලාභාලාභ ආකෘතිය

වෙනත් විස්තීර්ණ ආදායම්		
මුළු විස්තීර්ණ ආදායම්		
පරිපාලකගේ කොටස්හිමියන්ට අයත් මුළු විස්තීර්ණ ආදායම		
පාලනයට යටත් නොවන අයිතියට අයත් මුළු විස්තීර්ණ ආදායම		

මුළු විස්තීර්ණ ආදායමින් පාලනයට යටත් නොවන අයිතිය අඩු කළ පසු අගය

පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටස වගුවෙන් ලබාගත හැක.

8

පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටස

පාලනයට යටත් නොවන අයිතියේ ප්‍රතිශතය | %

විස්තරය	පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටස	පාලනයට යටත් නොවන අයිතියේ වෙනත් විස්තීර්ණ ආදායම් කොටස
පොත් අගය		
(+ / -) ගැලපුම්		
පරිපාලිත විකුණුම්කරු නම් උපලබ්ධි නොවූ ලාභය		
පරිපාලිත ගැනුම්කරු නම් උපලබ්ධි නොවූ ලාභය මත ක්ෂය		
අවසාන ශේෂය		

පාලනයට යටත් නොවන අයිතියේ මුළු විස්තීර්ණ ආදායම

9

ඒකාබද්ධ ලාභාලාභ ගිණුමේ ද්විත්ව සටහන් තීරණය කරන විදිහ



10

JMC vLearning "your virtual learning partner"

වෙනත් ඒකාබද්ධ ගැලපුම්

අන්තර් සමාගම් ශේෂ ඉවත් කිරීම

JMC Jayasekera Management Centre 11

11

පරිපාලක සහ පරිපාලිත අතර සිදුවන ගණුදෙනු නිසා එක් සමාගමකට ආදායම් අනිත් සමාගමට වියදම් ඇති වේ. ඒවා එකිනෙක සහ හිලව් කළ යුතුය.

JMC Jayasekera Management Centre 12

12

සංකල්පය තේරුම් ගමු



JMC Jayasekera Management Centre 13

13

තොගය තුල ඇතුලත් උපලබ්ධි නොවූ ලාභය ඉවත් කිරීම

අන්තර් සමාගම් ගනුදෙනු තුල ලාභය ඇතුලත් නොවිකුණූ තොගයක් වේ නම්, එම තොගය තුල ඇතුලත් ලාභය ඉවත් කළ යුතුය.

JMC Jayasekera Management Centre 14

14

JMC vLearning "your virtual learning partner"

මිල කිරීම්

ගනුදෙනු මිල කිරීම සඳහා සමාගම් ක්‍රම දෙකක් අනුගමනය කරයි

- මිල කිරීම
  - විකුණුම් මිල මත
    - විකුණුම් මිල මත
    - ලාභය/විකුණුම් මිල X 100
    - උදාහරණ විකුණුම් මිල මත ලාභය 20%
      විකුණුම් මිල = විකුණුම් පිරිවැය + ලාභය
      100 = 80 + 20
  - විකුණුම් පිරිවැය මත
    - විකුණුම් පිරිවැය මත
    - ලාභය/විකුණුම් පිරිවැය X 100
    - උදාහරණ විකුණුම් පිරිවැය මත ලාභය 20%
      විකුණුම් මිල = විකුණුම් පිරිවැය + ලාභය
      120 = 100 + 20

JMC Jayasekera Management Centre 15

15

සංකල්පය තේරුම් ගමු



JMC Jayasekera Management Centre 16

16

JMC vLearning "your virtual learning partner"

උපලබ්ධි නොවූ ලාභය ඉවත්කිරීමේ පියවර

ගැනුම්කරු විකුණුම්කරු හඳුනාගන්න

↓

උපලබ්ධි නොවූ ලාභය ගණනය කරන්න

විකුණුම් මිල මත ලාභය

ඒකක විකුණුම් මිල සහ ඒකක ලාභය ගණනය කරන්න
විකුණුම් මිල = විකුණුම් පිරිවැය + ලාභය
100 = (100 - ලාභය) + ලාභය

උපලබ්ධි නොවූ ලාභය = තොගය/ඒකක විකුණුම් මිල X ඒකක ලාභය

විකුණුම් පිරිවැය මත ලාභය

ඒකක විකුණුම් මිල සහ ඒකක ලාභය ගණනය කරන්න
විකුණුම් මිල = විකුණුම් පිරිවැය + ලාභය
(100 + ලාභය) = 100 + ලාභය

උපලබ්ධි නොවූ ලාභය = තොගය/ඒකක විකුණුම් මිල X ඒකක ලාභය

↓

උපලබ්ධි නොවූ ලාභය ඉවත්කරන්න

↓

කව්ද විකුණුම්කරු?

- පරිපාලක → ඒකාබද්ධ විකුණුම් පිරිවැය හර
ඒකාබද්ධ තොගය බැර
- පරිපාලිත → ඒකාබද්ධ විකුණුම් පිරිවැය හර
(පාලනයට යටත් නොවන අයිතියේ කොටස් ගලපන්න)
ඒකාබද්ධ තොගය බැර

JMC vLearning
"your virtual learning partner"

දේපල, පිරියත, උපකරණ තුල ඇතුලත් උපලබ්ධි නොවූ ලාභය

සමූහය තුල ලාභයක් සහිතව විකුණූ දේපල, පිරියත, උපකරණ තුල ඇතුලත් ලාභය සහ එම ලාභය මත ගැණුම්කරු ගණනය වන ක්ෂය ඉවත් කල යුතුයි.

JMC vLearning "your virtual learning partner"



දේපළ පිරියත උපකරණ තුල ඇතුලත් උපලබ්ධි නොවූ ලාභ ඉවත් කරන පියවර

විකුණුම්කරු හඳුනාගන්න

↓

උපලබ්ධි නොවූ ලාභය ගණනය කරන්න

↓

විකුණුම් ප්‍රතිශ්ඨාව	XX
(-) ධාරණ අගය	(XX)
ඉවත්කිරීම් ලාභය	**XX**

↓

උපලබ්ධි නොවූ ලාභය ඉවත් කරන්න

↓

විකුණුම්කරු කවුද?

- පරිපාලක
  - ඒකාබද්ධ වෙනත් ආදායම් හර
  - ඒකාබද්ධ දේපල, පිරියත, උපකරණ බැර
- පරිපාලිත
  - ඒකාබද්ධ වෙනත් ආදායම් හර
  - (පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටසට ගලපන්න)
  - ඒකාබද්ධ දේපල, පිරියත, උපකරණ බැර

21

දේපළ පිරියත උපකරණ තුල ඇතුලත් උපලබ්ධි නොවූ ලාභ ඉවත් කරන පියවර

ගැනුම්කරු හඳුනාගන්න

↓

උපලබ්ධි නොවූ ලාභය මත ක්ෂය ගණනය කරන්න

↓

ඉවත්කිරීම් ලාභය	XX (A)
ඉතිරි ඵලදායී ජීව කාලය	X (B)
භාවිතා කළ කාලය	X (C)
ඉවත්කිරීම් ලාභය මත ක්ෂය	X (D = A / B X C)

↓

උපලබ්ධි නොවූ ලාභය මත ක්ෂය ඉවත්කිරීම

↓

ගැනුම්කරු කවුද?

- පරිපාලිත
  - ඒකාබද්ධ දේපල, පිරියත, උපකරණ හර
  - ඒකාබද්ධ පරිපාලක/විකුණුම් පිරිවැය බැර
  - (පාලනයට යටත් නොවන අයිතියේ ලාභ කොටසට ගලපන්න)
- පරිපාලක
  - ඒකාබද්ධ දේපල, පිරියත, උපකරණ හර
  - ඒකාබද්ධ පරිපාලක/විකුණුම් පිරිවැය බැර

22

JMC vLearning "your virtual learning partner"

පරිපාලිතයේ ලාභාංශ

පරිපාලිතයේ ලාභාංශ වලින් පරිපාලකගේ කොටස අන්තර් සමාගම් ආදායමක් සහ වියදමක් වේ. එය එකිනෙක හිලව් කල යුතුය.

JMC Jayasekera Management Centre 23

23

පරිපාලිතයේ ලාභාංශ ඉවත් කරන පියවර



24

24

JMC vLearning your virtual learning partner

ප්‍රශ්න 01 - 2021 ජනවාරි ප්‍රශ්න 09

2020 ජනවාරි 01 දින **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු. මිලියන 85 කට අත්පත් කරගන්නා ලදි. එදිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය රු. මිලියන 95 ක් සහ පාලනය නොවන හිමිකමේ සාධාරණ අගය රු. මිලියන 25 ක් විය.

සීමාසහිත ඇල්ෆා පොදු සමාගමේ සහ **සීමාසහිත බීටා පොදු සමාගමේ** 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශ පහත සඳහන් පරිදි වේ.

(රු. '000)	ඇල්ෆා	බීටා
විකුණුම්	325,000	140,000
විකුණුම් පිරිවැය	(180,000)	(60,000)
දළ ලාභය	145,000	80,000
වෙනත් ආදායම්:		
කුලී ආදායම්	600	-
වෙනත් ආදායම්	500	500
වියදම්:		
බෙදාහැරීමේ වියදම්	(28,000)	(12,800)
පරිපාලන වියදම්	(48,000)	(24,000)
මූල්‍ය වියදම්	(2,500)	(1,800)
බදු පෙර ලාභය	69,600	41,900
ආදායම් බදු	(8,500)	(6,000)
වර්ෂය සඳහා ලාභය	61,100	35,900
වෙනත් විස්තීර්ණ ආදායම	-	-
මුළු විස්තීර්ණ ආදායම	61,100	35,900

JMC vLearning "your virtual learning partner"

ප්‍රශ්න 01 - 2021 ජනවාරි ප්‍රශ්න 09

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) වර්ෂය තුලදී **සීමාසහිත ඇල්ෆා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** රු.6,000,000/- ක් වටිනා භාණ්ඩ විකුණනු ලැබූ අතර, එහි ලාභ ආන්තිකය පිරිවැය මත 25% ක් විය. 2020 දෙසැම්බර් 31 දිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** පැවති අවසන් තොගය තුළ **සීමාසහිත ඇල්ෆා පොදු සමාගමෙන්** මිලට ගත් භාණ්ඩවලින් 1/3 ක් ඇතුළත් විය.

(2) 2020 ඔක්තෝබර් 31 දින, **සීමාසහිත බීටා පොදු සමාගම**, පිරිවැය රු. 5,000,000/- ක් වූ ඉඩමක් **සීමාසහිත ඇල්ෆා පොදු සමාගමට** රු. 5,500,000/- කට විකුණනු ලදී.

ප්‍රශ්න 01 - 2021 ජනවාරි ප්‍රශ්න 09

(3) **සීමාසහිත බීටා පොදු සමාගම** විසින් **සීමාසහිත ඇල්ෆා පොදු සමාගමේ** ගබඩාව භාවිතයට ගැනීම නිසා මාසිකව රු. 50,000/- ක කුලියක් **සීමාසහිත ඇල්ෆා පොදු සමාගමට** ගෙවන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවන කීර්තිනාමය **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 09)

ප්‍රශ්න 02 - 2018 ජනවාරි ප්‍රශ්න 09

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගැමුණු පොදු සමාගමේ** සහ **සීමාසහිත බිමා සමාගමේ** විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත වේ.

(රු. '000)	ගැමුණු	බිමා
විකුණුම්	250,000	110,000
විකුණුම් පිරිවැය	(140,000)	(72,000)
දළ ලාභය	110,000	38,000
වෙනත් ආදායම්:		
පොලී ආදායම	800	250
ලාභාංශ ආදායම	1,600	45
වෙනත් ආදායම්	1,550	-
	113,950	38,295
වියදම්:		
බෙදාහැරීමේ වියදම්	(40,000)	(13,500)
පරිපාලන වියදම්	(10,000)	(3,000)
මූල්‍ය වියදම්	(8,000)	(2,000)

ප්‍රශ්න 02 - 2018 ජනවාරි ප්‍රශ්න 09

බදු පෙර ලාභය	55,950	19,795
ආදායම් බදු	(14,500)	(2,000)
වර්ෂය සඳහා ලාභය	41,450	17,795
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	41,450	17,795

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) වර්ෂය තුලදී **සීමාසහිත ගැමුණු පොදු සමාගම** විසින් පිරිවැයට 25% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ තොග **සීමාසහිත බිමා සමාගමට** රු. 2,000,000/- කට විකුණන ලදි. **සීමාසහිත බිමා සමාගමේ** 2017 මාර්තු 31 දිනට පැවති අවසන් තොගය තුළ **සීමාසහිත ගැමුණු පොදු සමාගමෙන්** මිලට ගත් රු. 500,000/- ක් වටිනා භාණ්ඩ ඇතුලත් වේ.

JMC vLearning "your virtual learning partner"

ප්‍රශ්න 02 - 2018 ජනවාරි ප්‍රශ්න 09

(2) **සීමාසහිත ගැමුණු පොදු සමාගමේ** කර්මාන්තශාලා පරිශ්‍රයේ පිහිටි **සීමාසහිත බිමා සමාගමේ** ගබඩා සඳහා වූ කුලිය ලෙස රු. 50,000/- ක මාසික කුලියක් 2016 අප්‍රේල් 01 දිනට සිට **සීමාසහිත බිමා සමාගම** විසින් **සීමාසහිත ගැමුණු සමාගම** වෙත ගෙවන ලදි.

(3) **සීමාසහිත බිමා සමාගම** විසින් වර්ෂයකට 12% ක පොලී අනුපාතයකට යටත්ව රු. 5,000,000/- ක ණයක් **සීමාසහිත ගැමුණු පොදු සමාගමෙන්** 2016 මාර්තු 31 දින ලබා ගන්නා ලදි. 2016/17 වර්ෂයට අදාල පොලිය **සීමාසහිත ගැමුණු පොදු සමාගමට** සම්පූර්ණයෙන් ගෙවා ඇත. වර්ෂය තුලදී ප්‍රාග්ධන ආපසු ගෙවීමක් සිදුකර නොමැත.

(4) **සීමාසහිත ගැමුණු පොදු සමාගමේ** ලාභාංශ ආදායම තුළ **සීමාසහිත බිමා සමාගමෙන්** ලද රු. 500,000/- ක අතුරු ලාභාංශයක් ඇතුළත් අතර, **සීමාසහිත බිමා සමාගම** විසින් මෙම ලාභාංශය ගෙවා ඇත්තේ වර්ෂයේ ලාභය භාවිත කරගෙනය.

ප්‍රශ්න 02 - 2018 ජනවාරි ප්‍රශ්න 09

(5) 2017 ජනවාරි 01 දින රු. 1,000,000/- ක් පිරිවැය වූ ඉඩමක් සීමාසහිත ගැමුණු පොදු සමාගම විසින් **සීමාසහිත බිමා සමාගම** වෙත රු. 1,400,000/- කට විකුණන ලදි.

ඔබ විසින් කළ යුතු දෑ:

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න** (ලකුණු 14)

ප්‍රශ්න 03 - 2019 ජූලි ප්‍රශ්න 09

2018 අප්‍රේල් 01 දින, **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් සීමාසහිත බීටා පොදු සමාගමේ 1,000,000 (මිලියන 1) ක් වූ සාමාන්‍ය කොටස්වලින් 75% ක් රු. මිලියන 290 කට අත්පත් කරගන්නා ලදි. අත්පත් කරගත් දිනට **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය රු. මිලියන 340 කි. 2018 අප්‍රේල් 01 දිනට, **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** කොටසක වෙළඳපොල වටිනාකම රු. 365/- කි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** සහ **සීමාසහිත බීටා පොදු සමාගමේ** විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත වේ.

ප්‍රශ්න 03 - 2019 ජූලි ප්‍රශ්න 09

(රු. '000)	සිග්මා	බීටා
විකුණුම්	250,000	150,000
විකුණුම් පිරිවැය	(150,000)	(90,000)
දළ ලාභය	100,000	60,000
වෙනත් ආදායම්:		
පොලී ආදායම	1,200	950
ලාභාංශ ආදායම	500	-
වෙනත් ආදායම්	150	1,250
	101,850	62,200
වියදම්:		
බෙදාහැරීමේ වියදම්	(12,000)	(7,000)
පරිපාලන වියදම්	(60,000)	(46,000)
මූල්‍ය වියදම්	(6,000)	(4,000)
බදු පෙර ලාභය	23,850	5,200

JMC vLearning "your virtual learning partner"

ප්‍රශ්න 03 - 2019 ජූලි ප්‍රශ්න 09

(රු. '000)	සිග්මා	බීටා
ආදායම් බදු වියදම	(6,500)	(1,550)
වර්ෂය සඳහා ලාභය	17,350	3,650
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	17,350	3,650

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) වර්ෂය තුලදී **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** පිරිවැය රු. 5,000,000/- ක් වූ භාණ්ඩ පිරිවැය මත 10% ක ලාභාන්තිකයක් සහිතව විකුණන ලදි. **සීමාසහිත බීටා පොදු සමාගමේ** 2019 මාර්තු 31 දිනට පැවති අවසන් තොගය තුළ **සීමාසහිත සිග්මා පොදු සමාගමෙන්** මිලට ගත් රු. 1,100,000/- ක් වටිනා භාණ්ඩ ඇතුලත් වේ.

ප්‍රශ්න 03 - 2019 ජූලි ප්‍රශ්න 09

(2) මීට වර්ෂ දෙකකට ඉහතදී, **සීමාසහිත බීටා පොදු සමාගම**, **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් නිකුත් කරන ලද ණයකරවල රු. 5,000,000/- ක් ආයෝජනය කරන ලදි. මෙම ණයකරවල වාර්ෂික පොලී අනුපාතය 10% ක් වන අතර, කල්පිරීමේ කාලය වර්ෂ 05 කි. වර්ෂය සඳහා මෙම ණයකර මත ලැබූ පොලී ආදායම, **සීමාසහිත බීටා පොදු සමාගමේ** පොලී ආදායමේ ඇතුළත්ව ඇත.

(3) **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** අයත් ගබඩා පරිශ්‍රය 2018 අප්‍රේල් 01 දින සිට, භාවිතා කරන අතර, ඒ සඳහා රු. 50,000/- ක වාර්ෂික කුලියක් **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** ගෙවන ලදි

ප්‍රශ්න 03 - 2019 ජූලි ප්‍රශ්න 09

(4) 2018 අප්‍රේල් 01 දින, **සීමාසහිත බීටා පොදු සමාගම** විසින්, **සීමාසහිත සිග්මා පොදු සමාගමට** යන්ත්‍රයක් රු. 5,000,000/- කට විකුණන ලදි. එදිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** පොත්වල එම යන්ත්‍රයේ ධාරණ අගය රු. 4,000,000/- ක් ලෙස දක්වා තිබුණි. 2018 අප්‍රේල් 01 දිනට මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 10 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ඒකාබද්ධ කිරීමේදී පැන නඟින කීර්තිනාමය **ගණනය කරන්න.** (ලකුණු 05)

(b) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 14)

ප්‍රශ්න 04

සීමාසහිත "එච්" සමාගම 2017.04.01 දින සීමාසහිත "එස්" සමාගමේ ස්කන්ධ කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් අත්පත් කර ගත්තේය. එදින සීමාසහිත "එස්" සමාගමේ රඳවාගත් ඉපැයීම් ශේෂය රු. 620,000 කි. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ එම සමාගම් දෙකෙහි කෙටුම්පත් ආදායම් ප්‍රකාශන පහත පරිදි විය.

(රු. '000)	"එච්"	"එස්"
පිරිවැටුම	5,230	2,840
විකුණුම් පිරිවැය	(2,890)	(1,700)
දළ ලාභය	2,340	1,140
වෙනත් මෙහෙයුම් ආදායම්	440	260
බෙදාහැරීමේ පිරිවැය	(420)	(280)
පරිපාලන වියදම්	(840)	(560)
මූල්‍ය පිරිවැය	(98)	(60)
බදුවලට පෙර ලාභය	1,422	500
ආදායම් බදු වියදම්	(420)	(180)
කාලපරිච්ඡේදයේ ලාභය	1,002	320

JMC vLearning "your virtual learning partner"

ප්‍රශ්න 04

පහත සඳහන් තොරතුරු දී ඇත

1. වර්ෂය තුළදී සීමාසහිත "එච්" සමාගම රු. 400,000 ක ණය මුදලක් සීමාසහිත "එස්" සමාගමට ලබා දී ඇති අතර, සීමාසහිත "එස්" සමාගමේ මූල්‍ය පිරිවැයෙහි සීමාසහිත "එච්" සමාගමට මෙම ණය මුදල සඳහා ගෙවූ රු. 25,000 ක පොළිය ඇතුලත්ය

2. 2019.03.31 දිනට සීමාසහිත "එස්" සමාගමේ තොගයෙහි සීමාසහිත "එච්" සමාගම විසින් විකුණන ලද ඉන්වොයිස් මිලට රු. 60,000 ක් වටිනා භාණ්ඩ ඇතුලත්ය. සීමාසහිත "එච්" සමාගම සීමාසහිත "එස්" සමාගමට භාණ්ඩ අලෙවිකරනුයේ පිරිවැයට 25% ක ලාභයක් එකතු කිරීමෙනි

සීමාසහිත "එච්" සාමගම වර්ෂය තුළදී සීමාසහිත "එස්" සමාගමට කළ මුළු විකුණුම් ඉන්වොයිස් මිලට රු. 800,000 කි

ප්‍රශ්න 04

3. සීමාසහිත "එච්" සමාගම රු. 400,000 ක පිරිවැයට මිල දී ගත් යන්ත්‍රයක් 2018.04.01 දින රු. 500,000 කට සීමාසහිත "එස්" සමාගමට විකුණන ලදි. සමාගම් සමූහය වර්ෂයකට 10% බැගින් යන්ත්‍ර ක්‍ෂය කරයි. සීමාසහිත "එස්" සමාගම සඳහා දෙනු ලැබ ඇති කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයෙහි මෙම යන්ත්‍රය වෙනුවෙන් ක්‍ෂයවීම්ද වියදමක් ලෙස ඇතුලත්ය

4. අත්පත් කරගත් දිනට සීමාසහිත 'එස්' සමාගමේ ශුද්ධ වත්කම්හී ධාරණ අගය එදිනට සාධාරණ අගයට සමාන බව උපකල්පනය කරන්න

ඔබ විසින් පිළියෙල කළ යුතු දෑ:

2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා සීමාසහිත "එච්" සමාගමේ ඒකාබද්ධ ලාභාලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සහ

JMC vLearning your virtual learning partner

ප්‍රශ්න 05

2018.04.01 දින සීමාසහිත "එච්" සමාගම රුපියල් මිලියන 10 ක මුදල් ප්‍රතිෂ්ඨාවකට සීමාසහිත "එස්" සමාගමේ ස්කන්ධ ප්‍රාග්ධනයෙන් 75% ක් පවරා ගත්තේය. සීමාසහිත "එච්" සහ සීමාසහිත "එස්" සමාගම්වල 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශන පහත දක්වා ඇත.

රු.'000	සීමාසහිත "එච්"	සීමාසහිත "එස්"
ආදායම (විකුණුම්)	50,000	30,000
විකුණුම් පිරිවැය	(30,000)	(20,000)
දළ ලාභය	20,000	10,000
ලාභාංශ ආදායම	1,000	100
වෙනත් ආදායම්	800	200
මෙහෙයුම් වියදම්	(10,000)	(4,000)
මූල්‍ය වියදම්	(1,200)	(300)
බදු වලට පෙර ලාභය	10,600	6,000
බදු වියදම්	(2,500)	(1,800)
වර්ෂය සඳහා ලාභය	8,100	4,200
ගෙවූ ලාභාංශ	(2,300)	(800)
රඳවාගත් ලාභ	5,800	3,400

ප්‍රශ්න 05

ඔබට පහත සඳහන් වෙනත් තොරතුරු සපයා ඇත.

1. සීමාසහිත "එස්" සමාගම 2018 ඔක්තෝම්බර් 1 දින රුපියල් මිලියන 2.3 කට යන්ත්‍රයක් මිලට ගෙන එදිනම රුපියල් මිලියන 2.5 කට එය සීමාසහිත "එච්" සමාගමට මාරු කරන ලදි. සීමාසහිත "එච්" පිරිවැය පදනම මත සරල මාර්ග ක්‍රමයට, වර්ෂයකට 20% බැගින් යන්ත්‍ර ක්ෂය කරයි

2. 2019 ජනවාරි 1 දින සීමාසහිත "එස්" සමාගම "එච්" සමාගමෙන් 5% ක වාර්ෂික පොළියක් මත රුපියල් මිලියන 1 ක ණයක් ලබාගෙන ඇත. මෙම ණය මුදලට ලැබිය යුතු පොළී ආදායම සහ වියදම නිසි පරිදි ගිණුම් තබා ඇත

3. 2018 ඔක්තෝබර් 01 වන දින සමාගම විසින් තම ගොඩනැගිල්ල මාසිකව රු 15,000 බැගින් සමාගමට කුළියට ලබාදි ඇත සමාගම කුළී ආදායම නිසි පරිදි ගිණුම් තැබුවද, සමාගම කුළී වියදම ගිණුම් තබා නැත

ප්‍රශ්න 05

4. වර්ෂය තුළදී සීමාසහිත "එච්" සමාගම රුපියල් මිලියන 4.2 ක් ඉන්වොයිස් මිල වූ භාණ්ඩ, පිරිවැයෙන් 20% ක ලාභ ආන්තිකයක් සහිතව සීමාසහිත "එස්" සමාගමට විකුණා ඇත. සීමාසහිත "එස්" සමාගමේ අවසාන භාණ්ඩ තොගයෙහි, සීමාසහිත "එච්" සමාගමෙන් මිලට ගත් රු. 120,000 ක් ඉන්වොයිසි මිල වූ භාණ්ඩ ඇතුලත්ය

4. වර්ෂය තුළදී සීමාසහිත "එස්" සමාගම කොටසකට රු. 1 ක ලාභාංශයක් ගෙවා ඇත. නිකුත් කර ඇති මුළු කොටස් ගණන 800,000කි

5. 2019 මාර්තු 31 දිනට කීර්තිනාමය සඳහා කළ හානිකරණ පරීක්ෂණයේදී රු. 100,000 ක අගය හානිවීමක් සිදු වී ඇති බව හෙළිවිය

ඔබ කළ යුතු දෑ:
2019 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා සීමාසහිත "එච්" සහ සීමාසහිත "එස්" සමාගම්වල ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

JMC vLearning "your virtual learning partner"